# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது **EXTRAORDINARY**

අංක 916/11 – 1996 මාර්තු 28 වැනි බ්‍රහස්පතින්ද – 1996.03.28

916/11 ஆம் இலக்கம் — 1996 ஆம் ஆண்டு மாச்சு மாதம் 28 ஆம் திகதி வியாழக்கிழமை

**No. 916/11 – THURSDAY, MARCH 28, 1996**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) **(Published by Authority)**


## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. – බී. 59/41 III

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය සමග කියවිය යුතු 44 වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

ඉන්දික රූපසිංහ ගුණවර්ධන,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1996 මාර්තු මස 25 වැනි දින.
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 1996 පැරණි ඔලන්ද ඇල හා මුන්දලම කලපු ධීවර නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර –

(අ) පාලවි පාලමෙන් පටන් ගෙන මුන්දලම කලපුව හරහා මුන්දලම කලපුවේ දකුණු කෙළවර දක්වා දිවෙන ඔලන්ද ඇලේ කොටසට; සහ

(ආ) මුන්දලම කලපුවට අදාළ විය යුතුය.

2. 1 වන නියෝගයෙහි විස්තර කර ඇති ප්‍රදේශය තුළ උගුල් දැල් සහ අදින දැල් භාවිත කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

3. 1 වන නියෝගයෙහි විස්තර කර ඇති ප්‍රදේශයේ මසුන් ඇල්ලීම සඳහා සෙ.මී. 5.1කට (අඟල් දෙකට) අඩු ඇස් සහිත පාවෙන දැල් භාවිත කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

4. මේ නියෝග උල්ලංඝනය කරමින් භාවිත කරනු ලබන යම් ආම්පන්න පුත්තලම දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු හෝ විසින් වහාම ඉවත් කළ යුතුය.

5. මේ නියෝගවල–

"දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධරයා" යන්නෙන් ඔලන්ද ඇල පිහිටා ඇති දිස්ත්‍රික්කය සඳහා පත් කරනු ලැබූ නිලධරයෙක් අදහස් වේ ;

"අදින දැල" යන්නෙන් මෙහි පහත විස්තර කෙරෙන දැල් වර්ග තුනෙන් යම් වර්ගයක දැලක් අදහස් වේ :–

(අ) **කඩිප්පුව** .– මඩි ආකාර කොටසකින් හා දෙපසට විහිදෙන දිගින් මීටර් 5ක් හෝ 6ක් (අඩි 16 සිට 20 දක්වා) පමණ වන පියාත් දෙකකින් යුතු සෙ.මී. 1.6 (අඟල් 5/8) දැල් ඇස් සහිත වූ සාදන ලද දැලකි. පහත දරයට බරු සවිකර ඇති අතර දරවලට සම්බන්ධ කළ ලීවී දෙකක් මගින් මිනිසුන් දෙදෙනෙකු විසින් දැල ඇදගෙන යනු ලැබේ.

(ආ) ඊට වඩා කුඩා ඇස් සහිත දැල් ; හා

(ඇ) ඊට වඩා විශාල ඇස් සහිත දැල්.

1A – D 040153 – 1,960 (96/03)

මෙම දැල් සාමාන්‍යයෙන් මීටර් දෙකක (අඩි 6.5ක) පමණ උසකින් යුක්තය. දැල සෑදීමට යොද ගත්තා දැල් කැබලි ප්‍රමාණය අනුව දැලේ දිග තීරණය වන අතර, සාමාන්‍ය වශයෙන් දිග මීටර් 50–100 (අඩි 164–328) පමණ වෙයි.

කුඩා මසුන් සඳහා යොද ගත්තා දැලේ ඇසක ප්‍රමාණය සෙ.මී. 1.6 (අඟල් 5/8) වන අතර විශාල මසුන් සඳහා යොද ගත්තා දැලේ ඇස් ප්‍රමාණය සෙ.මී. 12.6 (අඟල් 5 )ක් පමණ වේ. මිනිසුන් කණ්ඩායම් දෙකක් විසින් දැල ඇදගෙන යනු ලැබේ.

''පාවෙන දැල'' යන්නෙන් මසුන් කරමලෙන් අසුවීමෙන් හෝ පැටලීමෙන් අල්ලා ගත්තා යම් චතුරශ්‍රාකාර හැඩය ඇති දැලක් අදහස් වේ ;

''ඕලන්ද ඇල'' යන්නෙන්, පුත්තලමේ සිට කොළඹ දක්වා අභ්‍යන්තර යාත්‍රා කිරීම සඳහා වූ ද මුන්දලම කලපුව මැදින් කොටසක් වැටී ඇත්තාවූ ද කෘත්‍රිම ජල මාර්ගය අදහස් වේ ;

''මුන්දලම කලපුව'' යන්නෙන්, වයඹ වෙරළේ පිහිටියාවූ ද, පුත්තලමේ සිට උඩප්පුවට විහිදෙන්නා වූ ද, කලපුව අදහස් වේ ;

''උගුල් දැල්'' යන්නෙන් (උණ වර්ගයක් වන) බටපතුරුවලින් හෝ (තාල වර්ගයේ ගස් වර්ගයක් වන) ඉඳි පතුරු වලින් මසුන් හා ඉස්සන් ඇල්ලීම සඳහා කලපුවේ සවිකරන උගුලක් අදහස් වන අතර, එය උගුලකින් සහ වැටකින් යුක්ත වේ.

04–310

# பகுதி I : தொகுதி (I) — பொது

## அரசாங்க அறிவித்தல்கள்

எல். டி. — பி. 59/41 III.

1996 ஆம் ஆண்டின் 2 ஆம் இலக்க கடற்றொழில், நீரியல் வளத்துறை சட்டம்

**1996 ஆம் ஆண்டின் 2 ஆம் இலக்க கடற்றொழில், நீரியல் வளத்துறை சட்டத்தின் 61 வது பிரிவுடன் வாசிக்கப்படும் 44 வது பிரிவின்கீழ் கடற்றொழில், நீரியல் வளத்துறை அபிவிருத்தி அமைச்சரினால் ஆக்கப்பட்ட ஒழுங்கு விதி.**

**இந்திக ரூபசிங்ஹ குணவர்தன,**
கடற்றொழில், நீரியல் வளத்துறை
அபிவிருத்தி அமைச்சர்.

கொழும்பு,
1996 மாச்சு 25.

ஒழுங்கு விதிகள்

1. இவ் ஒழுங்கு விதிகள் 1996 ஆம் ஆண்டின், பழைய ஒல்லாந்துக் கால்வாய், முந்தல் கடனீரேரி மீன்பிடி ஒழுங்குகள் என எடுத்துக்காட்டப்படலாம்.

(அ) பாலாவிப் பாலத்திலிருந்து ஆரம்பித்து முந்தல் கடனீரேரியினூடாக, முந்தல் கடனீரேரியின் தென் பகுதி முடியும் வரை செல்லும் ஒல்லாந்துக் கால்வாய்ப் பகுதி ;

அத்துடன்,

(ஆ) முந்தல் கடனீரேரி.

என்பவற்றிற்கு ஏற்புடையதாகும்.

2. ஆளெவரும் ஒழுங்கு விதி 1 இல் விபரிக்கப்பட்ட இடப்பரப்பில் பொறி வலைகளையும், இழுவை வலைகளையும் பயன்படுத்தலாகாது.

3. ஆளெவரும் 5.1 சென்றி மீற்றருக்கு (2 அங்குலத்திற்குக்) குறைந்த வலைக்கண் உள்ள ஒதுக்கு வலைகளை 1 ஆம் ஒழுங்கு விதியில் விபரிக்கப்பட்டுள்ள பகுதிகளில் மீன்பிடிக்கும் நோக்கத்திற்காகப் பயன்படுத்தலாகாது.

4. புத்தளம், கடற்றொழில் விரிவாக்க உத்தியோகத்தர் அல்லது வேறு எந்த அதிகாரமுள்ள ஒருவரினால், ஒழுங்கு விதிகளின் மீறலுக்கு ஏதாவது வகை வலைகளை இயக்குவதிலிருந்து அகற்றி வைக்கலாம்.